# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 42 දරන පලාත් සභා පනත

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 14 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

1987 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II, වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

1.50

තැපැල් ගාස්තුව : රු. 1.15

# 1987 අංක 42 දරන පළාත් සභා පනත

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 14 වන දින]

එල්. ඩී.—ඕ. 62/87

**පළාත් සභාවල අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ; පළාත් සභා රජයේ සේවයට අදාළ කාරණා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1987 අංක 42 දරන පළාත් සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන්නා වූ ද දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන දිනයට පසු දිනයක් හෝ දින නොවන්නාවූ ද යම් දිනයක හෝ දිනවල සිට ඒ පනතේ සියලු විධිවිධාන හෝ විධිවිධාන කිසිවක් හෝ ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### පළාත් සභාවල සාමාජිකත්වය

පළාත් සභාවේ නාමය සහ එහි මන්ත්‍රී ධුර සංඛ්‍යාව.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව ප්‍රකාර පළාතක් සඳහා පළාත් සභාවක් සංස්ථාපනය කරනු ලැබූ අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් ඒ සභාවට නමක් දී ඒ පළාත් සභාව සමන්විත විය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නියම කළ යුතු ය. ඒ සංඛ්‍යාව නියම කිරීමේ දී ඒ පළාත් සභාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පළාතක් සඳහා ද, ඒ පළාතේ භූමි ප්‍රමාණය හා ජනගහනය පිළිබඳ ව ජනාධිපතිවරයා සැලකිලිමත් විය යුතු ය.

පළාත් සභාවක මන්ත්‍රී ධුර සඳහා නුසුදුසුකම්.

3. යම්කිසි තැනැත්තෙක්—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1) වන ව්‍යවස්ථාවේ (අ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) ඡේදවල දක්වා ඇති කවර හෝ නුසුදුසුකමකට යටත් වේ නම්;

(ආ) පළාත් පාලන ආයතනයකට මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක දී ඡන්දය දීමට, යම් නීතියක් යටතේ නුසුදුස්සකුව සිටී නම්;

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම්;

(ඈ) වෙනත් යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු වේ නම් හෝ පළාත් සභා එකකට වැඩි ගණනකට තෝරා පත් කර ගනු ලැබීම පිණිස මන්ත්‍රීධුරාපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබ සිටී නම්;

(ඉ) පළාත් සභාවකට තෝරා පත් කර ගනු ලැබීම පිණිස පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ එකකට වැඩි ගණනක් විසින් මන්ත්‍රීධුරාපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබ සිටී නම්,

ඒ තැනැත්තා පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ ඒ පළාත් සභාවේ අසුන් ගැනීමට සහ ඒ පළාත් සභාවේ ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

2—ඒ 099537—10,110 (87/10)

...න්ත්‍රීවරයකු ...ය් ප්‍රතිඥාව ...න් දිවුරුම.

**4.** පළාත් සභා මන්ත්‍රීවරයකු විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් හෝ මන්ත්‍රීවරයකු වශයෙන් පළාත් සභාවේ අසුන් ගැනීම හෝ එහි දී ඡන්දය දීම හෝ නොකළ යුතුය.

...සුන් හිස් වීම.

**5.** (1) පළාත් සභා මන්ත්‍රීවරයකු—

(අ) 3 වන වගන්තියේ සඳහන් කවර වූ හෝ නුසුදුසුකමකට යටත් වුවහොත් ; හෝ

(ආ) සභාපතිවරයා අමතා තම අත්සන යටතේ යවන ලියවිල්ලක් මගින් තම අසුනෙන් ඉල්ලා අස් වුවහොත්

එවිට, පළාත් සභාවේ ඔහුගේ අසුන හිස් වන්නේ ය.

(2) පළාත් සභාවක මන්ත්‍රීවරයකු සභාවේ අවසරය නොලබා, දවස් අනූවක කාලයක් සභාවේ සියලු රැස්වීම්වලට සහභාගි නොවුවහොත්, ඔහුගේ අසුන හිස් වී ඇතැයි සභාව විසින් ප්‍රකාශයට පත් කළ හැක්කේ ය :

එසේ වුව ද, එකී දවස් අනූවේ කාලය ගණන් ගැනීමේ දී, අනුක්‍රමික දවස් හතරකට වැඩි කාලයක් සඳහා සභාවේ වාරාවසාන කර ඇති කාලයක් ගණන් නොගත යුතු ය.

දිවුරුම් දීමට පෙර හෝ නුසුදුස් සකුව සිටියදී හෝ පළාත් සභාවේ අසුන් ගැනීම සහ ඡන්දයදීම සම්බන්ධයෙන් දණ්ඩනය.

**6.** යම් තැනැත්තකු 4 වන වගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීමට පෙර හෝ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක් දැරීමට තමාට සුදුසුකම් නොමැති බව හැනහොත් තමා නුසුදුස්සකු වී ඇති බව දැන දැනම පළාත් සභාවක මන්ත්‍රීවරයකු වශයෙන් අසුන් ගත හොත් හෝ ඡන්දය දුනහොත්, එසේ අසුන් ගන්නා වූ හෝ ඡන්දය දෙන්නා වූ හෝ එක් එක් දවස වෙනුවෙන්, රජයට අය විය යුතු ණය මුදලක් සේ අය කර ගත යුතු රුපියල් එක් සියය බැගින් වන දණ්ඩනයකට ඔහු යටත් වන්නේ ය.

## II වන කොටස

### පළාත් සභාවල රැස්වීම් සහ වැඩකටයුතු කිරීම

සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා.

**7.** (1) සෑම පළාත් සභාවක් විසින් ම, හැකිතාක් ඉක්මණින්, සභාවේ මන්ත්‍රීවරයන් දෙදෙනකු, පිළිවෙළින් එම සභාවේ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් ධුර දැරීම සඳහා තෝරා ගත යුතු ය. සභාපති ධුරය හෝ නියෝජ්‍ය සභාපති ධුරය හිස් වන සෑම අවස්ථාවක ම සභාව විසින් අවස්ථෝචිත පරිදි, සභාපති ධුරය හෝ නියෝජ්‍ය සභාපති ධුරය දැරීම සඳහා වෙනත් මන්ත්‍රීවරයකු තෝරා ගත යුතු ය.

(2) පළාත් සභාවක සභාපතිවරයා ලෙස හෝ නියෝජ්‍ය සභාපතිවරයා ලෙස ධුරය දරන මන්ත්‍රීවරයකු—

(අ) සභාවේ මන්ත්‍රීවරයකු වීම නතර වුවහොත් ඔහුගේ ධුරය හිස් කළ යුතුය ;

(ආ) ඒ මන්ත්‍රීවරයා සභාපතිවරයා නම් නියෝජ්‍ය සභාපතිවරයාට ද, ඒ මන්ත්‍රීවරයා නියෝජ්‍ය සභාපතිවරයා නම් සභාපතිවරයාට ද, තමාගේ අත්සන යටතේ යවන ලියවිල්ලක් මගින් කවර වේලාවක දී වුව ද තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය;

(ඇ) සභාවේ (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) සම්පූර්ණ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව විසින් බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලබන සභාවේ යෝජනා සම්මතයක් මගින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, සභාව විසුරුවා හරිනු ලැබූ කවර අවස්ථාවක වුව ද, එසේ විසුරුවා හරිනු ලැබීමෙන් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම වන තෙක්, සභාපතිවරයා ඔහුගේ ධුරය හිස් නොකළ යුතු ය.

(3) සභාපතිවරයාගේ ධුරය හිස්ව පවත්නා විට, ඒ ධුරයේ කාර්ය නියෝජ්‍ය සභාපතිවරයා විසින් හෝ නියෝජ්‍ය සභාපතිවරයාගේ ධුරය ද හිස්ව පවතින්නේ නම්, සභාවේ කාර්ය පටිපාටිය පිළිබඳ රීති අනුව නිශ්චය කරනු ලැබිය හැකි සභාවේ යම් මන්ත්‍රීවරයකු විසින් හෝ ඉටු කරනු ලැබිය යුතු ය.

(4) සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට නියෝජ්‍ය සභාපතිවරයා විසින් හෝ ඔහු ද පැමිණ නොමැති විට සභාවේ කාර්ය පටිපාටිය පිළිබඳව රීති අනුව නිශ්චය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු විසින් හෝ එවැනි තැනැත්තකු ද පැමිණ නොමැති විට සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු විසින් හෝ සභාපතිවරයා ලෙස කාර්ය ඉටු කරනු ලැබිය යුතු ය.

(5) පළාත් සභාවේ සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට, පළාත් සභාව විසින් ප්‍රඥප්ති මගින් පිළිවෙළින් නියම කරනු ලැබිය හැකි යම් වැටුප් හා දීමනා ගෙවනු ලැබිය යුතු ය; තව ද තුත් කාර්යය සඳහා එසේ විධිවිධාන සලස්වනු ලබන තෙක්, ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව ආණ්ඩුකාරවරයා විසින් නියමයක් මගින් නිශ්චය කරන වැටුප් හා දීමනා ඒ සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය.

තමන් ඉවත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් සාකච්ඡා කරනු ලබන විට සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා මූලසුන නොදැරිය යුතු බව.

8. (1) පළාත් සභාවේ යම් රැස්වීමක දී සභාපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් සැලකිල්ලට භාජනව පවත්නා විට සභාපතිවරයා, හෝ නියෝජ්‍ය සභාපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සඳහා යෝජනා සම්මතයක් සැලකිල්ලට භාජනව පවත්නා විට නියෝජ්‍ය සභාපතිවරයා හෝ ඒ රැස්වීමට පැමිණ සිටිය ද, එහි මූලාසනය නොදැරිය යුතු අතර එවැනි සෑම රැස්වීමක් සම්බන්ධයෙන් ම 7 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන, සභාපතිවරයා හෝ අවස්ථාවෝචිත පරිදි නියෝජ්‍ය සභාපතිවරයා හෝ පැමිණ නොසිටින රැස්වීමක් සම්බන්ධයෙන් අදාළ වන ආකාරයට ම අදාළ විය යුතු ය.

(2) තමා ධුරයෙන් ඉවත් කිරීම සඳහා යම් යෝජනා සම්මතයක් පළාත් සභාව විසින් සැලකිල්ලට භාජනය කරන විට පළාත් සභාවේ රැස්වීමේ දී කථා කිරීමටත්, රැස්වීමේ කටයුතුවලට අන්‍යාකාරයෙන් සහභාගිවීමටත් සභාපතිවරයාට අයිතිවාසිකම ඇති අතර, 10 වන වගන්තියේ විධිවිධාන කෙසේ වුව ද ඒ යෝජනා සම්මතය මත මුල් අවස්ථාවේ දී පමණක් ඡන්දය දීමට හෝ ඒ රැස්වීමේ කටයුතුවල වෙනත් යම් කාරණයක් මත ඡන්දය දීමට හෝ ඔහුට හිමිකමක් ඇත්තේ ය. එහෙත් පක්ෂ ඡන්ද සංඛ්‍යාව හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වුවහොත් ඡන්දය දීමට ඔහුට හිමිකම නොතිබිය යුතු ය.

පළාත් සභා මන්ත්‍රීවරයන්ගේ බලතල හා වරප්‍රසාද.

9. (1) මේ පනතේ විධිවිධානවලට සහ පළාත් සභාවක කාර්ය පටිපාටිය විධිමත් කරන්නා වූ රීතිවලට සහ ස්ථාවර නියෝගවලට යටත්ව, සෑම පළාත් සභාවකම භාෂණයේ නිදහස ඇත්තේ ය.

(2) පළාත් සභාවේ දී හෝ එහි යම් කාරක සභාවක දී හෝ ප්‍රකාශ කරන ලද කිසිවක් හෝ දෙන ලද යම් ඡන්දයක් හෝ සම්බන්ධයෙන් පළාත් සභාවේ කිසිම මන්ත්‍රීවරයකු යම් අධිකරණයක යම් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු අතර, ඒ සභාවේ බලය ඇතිව හෝ බලය යටතේ හෝ එහි යම් වාර්තාවක්, පත්‍රිකාවක්, වැය සම්මත හෝ කටයුතු හෝ පළ කිරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙක් වගකිව යුතු නොවන්නේ ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන, පළාත් සභාවක හෝ එහි යම් කාරක සභාවක හෝ කථා කිරීමට සහ අන්‍යාකාරයෙන් ඒවායේ කටයුතුවලට සහභාගිවීමට යම් ලිඛිත නීතියක් ප්‍රකාර අයිතිවාසිකම ඇති තැනැත්තන් සම්බන්ධයෙන් ද, ඒ සභාවේ මන්ත්‍රීවරයන් සම්බන්ධයෙන් අදාළ වන ආකාරයට ම අදාළ වන්නේ ය.

සභාවේදී ඡන්දය දීම.

10. (1) මේ පනතේ අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇති අවස්ථාවන්හි හැර, පළාත් සභාවේ කවර හෝ රැස්වීමක දී ඉදිරිපත් කරනු ලබන සෑම ප්‍රශ්නයක් ම, සභාපතිවරයා හෝ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කරන තැනැත්තා හැර, රැස්වීමට පැමිණ ඡන්දය දෙන්නා වූ මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුත්තේ ය.

(2) පළමුකොට ඡන්ද විමසීමේ දී, සභාපතිවරයා හෝ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කරන තැනැත්තා ඡන්දය නොදිය යුතු නමුත් පක්ෂ ඡන්ද සංඛ්‍යාව හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වුවහොත් ඔහුට තීරක ඡන්දයක් හිමි වන්නේ ය ; ඔහු එම තීරක ඡන්දය දිය යුත්තේ ය.

(3) පළාත් සභාවක මන්ත්‍රී ධුරයක් හිස්ව තිබුණද පළාත් සභාවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. පළාත් සභාවේ අසුන් ගැනීමට හෝ පළාත් සභාවේ දී ඡන්දය දීමට හෝ වෙනත් අයුරකින් එහි කටයුතුවලට සහභාගිවීමට හෝ හිමිකමක් නොමැති යම් තැනැත්තකු පළාත් සභාවේ අසුන් ගත් බවක් හෝ පළාත් සභාවේ යම්කිසි රැස්වීමක දී ඡන්දය දුන් බවක් හෝ වෙනත් අයුරකින් එහි කටයුතුවලට සහභාගි වූ බවක් හෝ පසුව දැනගන්නට ලැබුණ ද ඒ රැස්වීමේ දී සිදු වූ සියලු කටයුතු බලසහිත වන්නේ ය.

(4) පළාත් සභාවක රැස්වීමක් සංයුක්ත වීම සඳහා අවශ්‍ය ගණපූර්ණය සභාවේ මන්ත්‍රීවරයන් මුළු සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය. මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක්

පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක සංඛ්‍යාවක් වන්නා වූ අවස්ථාවක පූර්ණ සංඛ්‍යාව සහ භාගයට වැඩි ආසන්නතම පූර්ණ සංඛ්‍යාව, පළාත් සභාවේ කාර්ය සඳහා මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් ලෙස සැලකිය යුතු ය.

(5) පළාත් සභාවක රැස්වීමක් පවත්නා අතරතුර යම් අවස්ථාවක ගණපූරණය නොමැති වුවහොත් සභාව අඩාළව කල් තැබීම හෝ ගණපූරණය සම්පූර්ණ වන තෙක් රැස්වීම අත්හිටුවීම, සභාපතිවරයාගේ හෝ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කරන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

11. පළාත් සභාවක් විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව එහි කාර්ය පටිපාටිය හා කටයුතු කරගෙන යාම විධිමත් කිරීම සඳහා රීති සෑදිය හැකි ය ; කාර්ය පටිපාටිය පිළිබඳ රීති.

එසේ වුව ද, පළාත් සභාව විසින්, එහි සභාපතිවරයා විමසීමෙන් පසුව ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව—

(අ) මුදල් කටයුතු කලට වේලාවට සම්පූර්ණ කරවා ගැනීම ;

(ආ) මුදල් පිළිබඳව කවර හෝ කාරණයකට අදාළව හෝ පළාතේ පළාත් සභා අරමුදලේ මුදල් විසර්ජනය සඳහා වූ ප්‍රඥප්ති යකට අදාළව හෝ පළාත් සභාවේ කාර්ය පටිපාටිය හා එහි කටයුතු කරගෙන යාම විධිමත් කිරීම ;

(ඇ) ආණ්ඩුකාරවරයා ඔහුගේ අභිමතය පරිදි ක්‍රියා කළ යුතු යයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ මේ පනතින් හෝ නියම කර ඇති තාක් දුරට ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි බලපාන යම් කාරණයක් පිළිබඳව සාකච්ඡා කිරීම හෝ ප්‍රශ්න කිරීම තහනම් කිරීම

සඳහා රීති සෑදිය යුතු ය.

12. (1) කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සිදුවී ඇතැයි කියනු ලබන අවිධිමත් භාවයක හේතුව මත පළාත් සභාවක යම් කටයුතු වල විලංගු භාවය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය. පළාත් සභාවල කටයුතු අධිකරණය විසින් විභාග නොකළ යුතු බව.

(2) පළාත් සභාවක කාර්ය පටිපාටිය හෝ කටයුතු කරගෙන යාම විධිමත් කිරීම පිණිස හෝ එහි නිසි පාලනය පවත්වාගෙන යාම පිණිස හෝ මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ බලතල පවරනු ලැබ ඇති, පළාත් සභාවේ කිසිම නිලධරයකු හෝ මන්ත්‍රීවරයකු, ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිම අධිකරණයක අධිකරණ බලයට යටත් නොවන්නේ ය.

13. පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වනු ලැබිය හැකි තාක් දුරට හැර, රජයේ දේපළ, පළාත් සභාවක් විසින් සාදනු ලබන කවර හෝ ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ හෝ නියම කරන සියලු බදුවලින් නිදහස් වන්නේ ය. රජයේ දේපළ බදු අය කිරීමෙන් නිදහස් කිරීම.

14. (1) පළාත් සභාවක වාරය අවසන් කිරීමේ හේතුවෙන්, කටයුතු නිම කරනු නොලැබ ඒ පළාත් සභාවෙහි පවත්නා ප්‍රඥප්තියක් අහෝසි නොවන්නේ ය. ප්‍රඥප්ති කෙටුම්පත් වල කාලය ඉකුත් වීම.

(2) කටයුතු නිම කරනු නොලැබ පළාත් සභාවක පවත්නා ප්‍රඥප්තියක්, ඒ සභාව විසුරුවා හැරීමේ දී අහෝසි වන්නේ ය.

ආණ්ඩුවේ කටයුතු කරගෙන යාම.

**15.** (1) ආණ්ඩුකාරවරයා යම් කටයුතු ඔහුගේ අභිමතය පරිදි කළයුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ එය යටතේ හෝ නියමිතව ඇත්තේ ද, ඒ කටයුතු හැර අමාත්‍යවරයන් අතර කටයුතු වෙන් කර දීම පිණිස, ආණ්ඩුකාරවරයා විසින් රීති සෑදිය යුතු ය.

(2) මේ පනතේ අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇති අවස්ථාවන්හි හැර, ආණ්ඩුකාරවරයාගේ සියලු විධායක ක්‍රියා අමාත්‍යවරයන්ගේ උපදෙස් මත හෝ නොඑසේව කරනු ලැබුව ද, ජනාධිපතිවරයාගේ නාමයෙන් කරනු ලැබූ සේ ප්‍රකාශිත විය යුතු ය.

(3) ජනාධිපතිවරයාගේ නාමයෙන් කරනු ලැබ ලියා අත්සන් කරන ලද නියමයන් සහ වෙනත් සාධන පත්‍ර ආණ්ඩුකාරවරයා විසින් සාදනු ලැබිය යුතු රීතිවල නිශ්චය කොට දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් සැබෑ බවට සහතික කළ යුතු අතර, එසේ සැබෑ බවට සහතික කරන ලද නියමයක හෝ සාධන පත්‍රයක වලංගු භාවය, එය ජනාධිපතිවරයා විසින් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද නියමයක් හෝ සාධන පත්‍රයක් නොවීමේ හේතුව මත, ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

ගිවිසුම් සහ නඩු.

**16.** (1) පළාතේ ආණ්ඩුකාරවරයාගේ විධායක බලය ක්‍රියාත්මක කිරීමේ දී ලා ඇතුළත් වන සියලු ගිවිසුම්වලට, ඒ පළාත සඳහා සංස්ථාපනය කරන ලද පළාත් සභාව සංස්ථාවක් වූවාක් සේ, ඒ පළාත් සභාවේ නාමයෙන් ඇතුළත් වී, එම ගිවිසුම් ඉටු කරනු ලැබිය යුතු ය.

(2) ඒ විධායක බලය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධයෙන් වන සියලු නඩු, ඒ පළාත් සභාව සංස්ථාවක් වූවාක් සේ, ඒ පළාත් සභාව විසින් හෝ ඊට විරුද්ධව හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ලේකම් කාර්යාලය.

**17.** (1) පළාත් සභාවකට, ඊට ම අයත් ලේකම් කාර්ය මණ්ඩලයක් විය යුතු ය.

(2) පළාත් සභාවක ලේකම් කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන තැනැත්තන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ සේවා කොන්දේසි ඒ පළාත් සභාව විසින් ප්‍රඥප්ති මගින් විධිමත් කළ හැකි ය.

පළාත් සභාවල සාකච්ඡා පිළිබඳ සීමා.

**18.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාවේ (4) වන ඡේදය යටත්ව, ජනාධිපතිවරයාගේ හෝ ආණ්ඩුකාරවරයාගේ හෝ අධිකරණ නිලධරයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ හෝ හැසිරීම පිළිබඳව පළාත් සභාවක දී කිසිදු සාකච්ඡාවක් නොවිය යුතු ය.

## III වන කොටස

## මුදල්

පළාතේ පළාත් සභා අරමුදල.

**19.** (1) එක් එක් පළාත සඳහා පළාත් සභා අරමුදලක් විය යුතු ය :—

(අ) ඒ පළාතේ පළාත් සභාව විසින් පනවන ලද සියලු බදුවලින් ලැබෙන මුදල් ;

(ආ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඒ පළාත සම්බන්ධයෙන් ඒ පළාත් සභාවට කරන ලද සියලු ප්‍රදානයන්හි මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් පළාත් සභාවට දෙන ලද සියලු ණය මුදල් ; සහ

(ඈ) පළාත් සභාවේ වෙනත් සියලු ලැබීම්

ඒ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(2) පළාතක පළාත් සභා අරමුදලින් කිසිම මුදලක්, මේ පනතට අනුකූලව ද මේ පනතේ විධිවිධාන සලසා ඇති කාර්ය සඳහා ද ආකාරයෙන් ද හැර ප්‍රයෝජනයට නොගත යුතු ය.

(3) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අත්සන යටතේ වූ බලපත්‍රයක් යටතේ හැර, පළාතක පළාත් සභා අරමුදලින් කිසිම මුදලක් ඉවත් කර නොගත යුතු ය.

(4) පළාතේ පළාත් සභා අරමුදලින් යම් මුදලක් ඉවත් කර ගැනීමේ දී, ඒ මුදල අරමුදලින් ඉවත් කර ගන්නා වූ මුදල් වර්ෂය වෙනුවෙන් සේවාවන් සඳහා පළාත් සභාවේ ප්‍රඥප්තියක් මගින් ඒ මුදල වෙන් කර දී ඇත්නම් මිස, නැතහොත් ඒ මුදල වෙනස් ආකාරයකින් නීත්‍යනුකූලව පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් කරනු ලැබුවහොත් මිස, එවැනි බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(5) පළාතක පළාත් සභා අරමුදලේ භාරය, ඒ අරමුදලට මුදල් ගෙවීම, සහ ඒ කාරණාවලට සම්බන්ධ හෝ අනුයාත වෙනත් සියලු කරුණු ආණ්ඩුකාරවරයා විසින් සාදනු ලබන රීති මගින් විධිමත් කරනු ලැබිය යුතු ය.

**පළාතේ හදිසි අවස්ථා අරමුදල.**

20. (1) "පළාතේ හදිසි අවස්ථා අරමුදල" යන නමින් හැඳින්වෙන අග්‍රිමය ස්වභාවයේ වූ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවිය යුතු ය. ඒ අරමුදලට පළාත් සභාව විසින් කලින් කල ප්‍රඥප්ති මගින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයන් පළාත් සභා අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. තවද හදිසි අවස්ථා අරමුදලින් ආණ්ඩුකාරවරයා විසින් අත්තිකාරම් මුදල් ගෙවිය හැකි වනු පිණිස ඒ අරමුදලේ භාරය ආණ්ඩුකාරවරයා විසින් දැරිය යුතු ය.

(2) 26 වන සහ 27 වන වගන්ති යටතේ සාදන ලද ප්‍රඥප්ති මගින් වූ විසර්ජන යටතේ පළාත් සභාව විසින් බලය දෙනු ලබන තෙක්, බලාපොරොත්තු නොවූ වියදම් දැරීම සඳහා හැර, පළාතේ හදිසි අවස්ථා අරමුදලින් කිසි අත්තිකාරමක් නොගෙවිය යුතු ය.

(3) පළාතේ හදිසි අවස්ථා අරමුදලේ භාරය, ඒ අරමුදලට මුදල් ගෙවීම, සහ ඒ අරමුදලින් මුදල් ඉවත්කර ගැනීම හා සම්බන්ධ හෝ ඊට අනුයාත සියලු කරුණු විධිමත් කිරීම සඳහා ආණ්ඩුකාරවරයා විසින් රීති සෑදිය හැකි ය.

**ණය සඳහා ආණ්ඩුව ඇපවීම.**

21. (1) පළාත් සභාවක් විසින් ලබාගන්නා ණය මුදල සම්බන්ධයෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඇපවීම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඇපවීමක් කළ වහාම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒ ඇපවීම පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ඇපවීමක් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන යම් මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ ඇපවීමක් ඉටුකිරීම පිණිස ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන අනු ප්‍රමාණයක පොලියක් ද සමඟ, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ කාලසීමාව ඇතුළත, පළාත් සභාව විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(5) පළාත් සභාවක් සඳහා ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් දෙන ණය මුදලක යම් කොටසක් හෝ (1) වන උපවගන්තිය යටතේ ඇපවීමක් කර ඇති ණය මුදලක යම් කොටසක් හෝ ආපසු ගෙවීමට ඉතිරිව ඇත් නම්, ඒ පළාත් සභාව විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, යම් ණය මුදලක් ලබා ගත නොහැකි ය.

පළාත්වල ව්‍යාපෘති සඳහා විදේශාධාර.

22. ආණ්ඩුව විසින් පළාතක ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා ලබාගන්නා විදේශාධාර ආණ්ඩුව විසින් ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය සඳහා වෙන් කර දෙනු ලැබිය යුතු ය.

විගණනය.

23. (1) පළාතක පළාත් සභා අරමුදල විගණනය කිරීම සහ එහි ගිණුම් සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ වන්නේ ය.

(2) පළාතක පළාත් සභා අරමුදලේ ගිණුම් හා සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ඔහු විසින් එය පළාත් සභාව ඉදිරියේ තැබීමට සැලැස්විය යුතු ය.

මුදල් කටයුතු හා සම්බන්ධ ප්‍රඥප්ති පිළිබඳ විශේෂ කාර්ය පටිපාටිය.

24. (1) පළාත් සභාවක් විසින් ප්‍රඥප්ති සාදනු ලැබීමට බලය ඇති යම් විෂයයක් හා සම්බන්ධ යම් ප්‍රඥප්තියක් මගින් මෙහි පහත දැක්වෙන කවර හෝ කාරණයක් සඳහා, එනම්:—

(අ) යම් බද්දක් පැනවීම, අහෝසි කිරීම, අඩු කිරීම, වෙනස් කිරීම හෝ විධිමත් කිරීම ;

(ආ) පළාතේ පරිපාලනය හා සම්බන්ධ ව භාරගෙන ඇති හෝ භාර ගැනීමට ඇති යම් මුදල් පිළිබඳ බැඳීම් සම්බන්ධයෙන් වන නීතිය සංශෝධනය කිරීම ;

(ඇ) පළාතේ පළාත් සභා අරමුදලේ මුදල් විසර්ජනය කිරීම ;

(ඈ) යම් වියදමක් පළාතේ පළාත් සභා අරමුදලට වැයබරක් විය යුතු වියදමක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හෝ යම් වියදමක මුදල් ප්‍රමාණය වැඩි කිරීම ;

(ඉ) පළාතේ පළාත් සභා අරමුදල සඳහා මුදල් භාර ගැනීම හෝ එම මුදල්වල භාරය දැරීම සහ ඒ මුදල් නිකුත් කිරීම

සඳහා විධිවිධාන සළසන්නේ නම්, ඒ ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාගේ නිර්දේශයක් මත හැර, පළාත් සභාවකට ඉදිරිපත් කිරීම හෝ පළාත් සභාවක දී යෝජනා කිරීම හෝ නොකළ යුතු ය.

(2) ප්‍රඥප්තියක් මගින් දඩ හෝ වෙනත් මුදල් දණ්ඩන නියම කිරීම සඳහා හෝ බලපත්‍ර සඳහා වූ ගාස්තු නැතහොත් සපයන ලද සේවා සඳහා වූ ගාස්තු ඉල්ලීම හෝ ගෙවීම සඳහා හෝ විධිවිධාන සැලසීමේ හේතුවෙන් ම පමණක් නැතහොත්, යම් පළාත් පාලන ආයතනයක් හෝ මණ්ඩලයක් විසින් ප්‍රාදේශීය අරමුණු සඳහා යම් බද්දක් නියම කිරීම, අහෝසි කිරීම, අඩු කිරීම, වෙනස් කිරීම හෝ විධිමත් කිරීම පිණිස විධිවිධාන සැලසීමේ හේතුවෙන්ම පමණක්, ඒ ප්‍රඥප්තියෙන් ඉහත කී කවර හෝ කාරණයක් සඳහා විධිවිධාන සලසන්නේයැයි නොසැළකිය යුතු ය.

(3) යම් ප්‍රඥප්තියක් පනවා ක්‍රියාත්මක කරනු ලැබුවහොත් ඉන් පළාතේ පළාත් සභා අරමුදලින් මුදල් වැය කිරීමේ ප්‍රතිඵලය ඇත් වේද, ඒ ප්‍රඥප්තිය සලකා බලන ලෙස ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාවට නිර්දේශ කර ඇත්නම් මිස, පළාතේ පළාත් සභාව විසින් එය සම්මත නොකළ යුතු ය.

25. (1) පළාතක ආණ්ඩුකාරවරයා විසින් සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ම, ඒ මුදල් වර්ෂය අවසාන වීමට යටත් පිරිසෙයින් මාස පහකට පෙර මේ කොටසෙහි "වාර්ෂික මුදල් ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන ඒ වර්ෂය සඳහා පළාතේ ඇස්තමේන්තුගත ලැබීම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශයක්, ඒ පළාතේ පළාත් සභාව ඉදිරියේ තබනු ලැබීමට සැලැස්විය යුතු ය. වාර්ෂික මුදල් ප්‍රකාශය.

(2) වාර්ෂික මුදල් ප්‍රකාශයේ අන්තර්ගත වියදම් ඇස්තමේන්තුවලින්—

(අ) පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් විය යුතු වියදම් ලෙස මේ ආනතින් විස්තර කර ඇති වියදම් දැරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයන් ; සහ

(ආ) පළාතේ පළාත් සභා අරමුදලින් කිරීමට යෝජිත වෙනත් වියදම් දැරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයන්

වෙන වෙනම පෙන්වා තිබිය යුතු අතර, ආදායම් ගිණුම මත වියදම් වෙනත් වියදම්වලින් වෙන් කොට දැක්විය යුතු ය.

(3) මෙහි පහත දැක්වෙන වියදම් පළාතක පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදම් වන්නේය :—

(අ) ආණ්ඩුකාරවරයාගේ පාරිශ්‍රමික සහ දීමනා ;

(ආ) ශ්‍රී ලංකාවේ, ඒකාබද්ධ අරමුදලින්, පළාත් සඳහා දෙන ලද ණය මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලී, ක්‍රමක්ෂය ගෙවීම්ද, ඇතුළු අයකිරීම් සහ ඒ හා සම්බන්ධ වෙනත් වියදම් ;

(ඇ) පළාත් සභාවේ සභාපතිවරයාගේ සහ නියෝජ්‍ය සභාපතිවරයාගේ වැටුප් සහ දීමනා ;

(ඈ) පළාත් සභාවට විරුද්ධව කවර හෝ අධිකරණයක් හෝ බේරුම්කාර විනිශ්චය අධිකාරයක් විසින් දෙන ලද නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ තීරණයක් ඉටු කිරීම පිණිස අවශ්‍ය යම් මුදල් ප්‍රමාණ ;

(ඉ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියකින් හෝ පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්තියකින් හෝ එසේ වැය බරක් විය යුතු යැයි ප්‍රකාශිත වෙනත් කවර හෝ වියදම්.

ඇස්තමේන්තු සම්බන්ධයෙන් පළාත් සභාවල කාර්ය පටිපාටිය.

**26.** (1) ඇස්තමේන්තු අතුරින්, පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් කර ඇති වියදම්වලට අදාළ ඇස්තමේන්තු පළාත් සභාවේ සම්මත කිරීම සඳහා ඉදිරිපත් නොකළ යුතු ය. එසේ වුව ද, ඒ කවර වූ හෝ ඇස්තමේන්තුවක් පිළිබඳව පළාත් සභාවේ දී සාකච්ඡා කිරීම මේ උපවගන්තියේ ඇතුළත් කිසිවකින් වැළැක් වෙන බවක් තේරුම් නොගත යුතුය.

(2) ඒ ඇස්තමේන්තු අතුරින් වෙනත් වියදම්වලට අදාළ වන ඇස්තමේන්තු, ප්‍රදාන සඳහා ඉල්ලීම් වශයෙන් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලීමකට එකඟවීමට හෝ එකඟ වීම ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් යම් ඉල්ලීමක සඳහන් මුදල් ප්‍රමාණය අඩු කිරීමට යටත්ව ඒ ඉල්ලීමට එකඟ වීමට පළාත් සභාවට බලය ඇත්තේ ය.

(3) ආණ්ඩුකාරවරයාගේ නිර්දේශය මත හැර ප්‍රදානයක් සඳහා වූ කිසිම ඉල්ලීමක් නොකළ යුතු ය.

විසර්ජන ප්‍රඥප්තිය.

**27.** (1) 26 වන වගන්තිය යටතේ ප්‍රදානවලට සභාව විසින් එකඟත්වය දීමෙන් පසු හැකි ඉක්මණින්—

(අ) පළාත් සභාව විසින් එසේ දෙන ලද ප්‍රදාන; සහ

(ආ) පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් කර ඇත්තා වූ එහෙත් සභාව ඉදිරියේ පූර්වයෙන් තබන ලද ප්‍රකාශයේ පෙන්වා ඇති මුදල් ප්‍රමාණය කිසි අවස්ථාවක දී නො ඉක්මවන්නා වූ වියදම්

පියවීම සඳහා අවශ්‍ය සියලුම මුදල් පළාතේ පළාත් සභා අරමුදලින් විසර්ජනය කිරීමට විධිවිධාන සැලසීම සඳහා ප්‍රඥප්තියක් ඉදිරිපත් කළ යුතු ය.

(2) එසේ කරන ලද ප්‍රදානයක මුදල් ප්‍රමාණය වෙනස් කරන්නා වූ හෝ එය වැය කරන කාර්යය වෙනස් කරන්නා වූ නැතහොත් පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් කරන ලද යම් වියදමක මුදල් ප්‍රමාණය වෙනස් කරන්නා වූ කිසිම සංශෝධනයක්, පළාත් සභාවේ දී එවැනි ප්‍රඥප්තියකට යෝජනා කරනු නොලැබිය යුතු අතර, සංශෝධනයක් මේ උපවගන්තිය යටතේ අනාවේශ්‍ය ද යන්න පිළිබඳව මූලාසනය දරන තැනැත්තාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(3) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කරන විසර්ජනයක් යටතේ හැර, පළාතේ පළාත් සභා අරමුදලින්, කිසිම මුදලක් ඉවත් කර නොගත යුතු ය.

28. (1) ආණ්ඩුකාරවරයා විසින්— පරිපූරක ප්‍රදාන.

(අ) පවත්නා මුදල් වර්ෂයේ දී යම් නිශ්චිත සේවාවක් සඳහා වැය කිරීම පිණිස 27 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව සාදන ලද යම් ප්‍රඥප්තියක් මගින් බලය දෙන ලද මුදල් ප්‍රමාණය එම වර්ෂයේ කාර්යය සඳහා ප්‍රමාණවත් නොවන බව පෙනී ගිය හොත් හෝ පවත්නා මුදල් වර්ෂය සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශයේ බලාපොරොත්තු නොවූ කිසියම් අලුත් සේවාවක් සඳහා වැය කිරීම පිණිස පරිපූරක හෝ අතිරේක වියදම් සඳහා ඒ වර්ෂයේදී අවශ්‍යතාවක් උද්ගත වූ විටක ; හෝ

(ආ) කිසියම් මුදල් වර්ෂයක් තුළ දී යම් සේවාවක් සඳහා ප්‍රදානය කර ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් එම සේවාව සඳහා එම වර්ෂයේදී වැය කර ඇත් නම්

ඇස්තමේන්තු කරන ලද එම වියදම දැක්වෙන වෙනත් ප්‍රකාශයක් පළාත් සභාව ඉදිරියේ තැබීමට හෝ ඒ වැඩිපුර වැය කර ඇති මුදල සඳහා ඉල්ලීමක්, එවැනි පූර්ව අනුමතියක් සහිතව පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට හෝ අවස්ථාවෝචිත පරිදි සැලැස්විය යුතු ය.

(2) එවැනි යම් ප්‍රකාශයක් සහ වියදම් හෝ ඉල්ලීම් හා සම්බන්ධයෙන් ද ඒ වියදම් දැරීම සඳහා හෝ ඒ ඉල්ලීමට අදාළ ප්‍රදානය සඳහා හෝ පළාතේ පළාත් සභා අරමුදලින් මුදල් විසර්ජනයට බලය ලබා ගැනීම පිණිස සාදන යම් ප්‍රඥප්තියක් සම්බන්ධයෙන් ද, 25 වන, 26 වන සහ 27 වන වගන්තිවල විධිවිධාන ඒවා වාර්ෂික මුදල් ප්‍රකාශය සහ එහි සඳහන් වියදම් සම්බන්ධව හෝ ප්‍රදානයක් සඳහා වන ඉල්ලීමක් සම්බන්ධව ද ඒ වියදම් හෝ ප්‍රදානය දීමට පළාතේ පළාත් සභා අරමුදලින් මුදල් විසර්ජනය සඳහා බලය ලබා ගැනීම පිණිස සාදන ප්‍රඥප්තිය සම්බන්ධව ද බලපාන්නා වූ ආකාරයෙන් ම බලපාන්නේ ය.

29. (1) මේ කොටසේ මීට පූර්වයෙන් ඇති විධිවිධානවල කුමක් සඳහන් වුවද, කිසියම් මුදල් වර්ෂයක කොටසක් සඳහා ඇස්තමේන්තු කළ වියදම් සම්බන්ධයෙන් අත්තිකාරම් වශයෙන් යම් ප්‍රදානයක් එවැනි ප්‍රදානයක් වැය සම්මත කිරීම සඳහා 26 වන වගන්තියේ නියමිත කාර්ය පටිපාටිය සම්පූර්ණ කිරීම සහ එම වියදම් සම්බන්ධයෙන් 27 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ප්‍රඥප්තියක් සම්මත කිරීම ඒ ප්‍රදානය කිරීමෙන් මාස හතරක කාලසීමාවක් ඇතුළත සිදු කිරීම බලාපොරොත්තුවෙන්, කිරීමට, පළාත් සභාවට බලය ඇති අතර, එකී ප්‍රදානය කරනු ලබන්නේ යම් කාර්ය සඳහා ද ඒ කාර්ය සඳහා පළාතේ පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමට ප්‍රඥප්තියක් මගින් බලය දීමට පළාත් සභාවට බලය ඇත්තේය. අතුරු සම්මත ගිණුම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ප්‍රදානයක් කිරීම සම්බන්ධව හෝ එම උපවගන්තිය යටතේ සෑදිය යුතු වන යම් ප්‍රඥප්තියක් සම්බන්ධව, 26 වන සහ 27 වන වගන්තිවල විධිවිධාන, වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් යම් වියදමකට අදාළව

ප්‍රදානයක් කිරීම සම්බන්ධයෙන් සහ ඒ වියදම් පියවීම පිණිස පළාතේ පළාත් සභා අරමුදලින් මුදල් විසර්ජනය කර ගැනීමට බලය ලබා ගැනීම සඳහා සෑදිය යුතු ප්‍රඥප්තිය සම්බන්ධයෙන් බලපාන්නා වූ ආකාරයෙන් ම බලපාන්නේ ය.

පළාත් සභාව විසින් අනුමත කිරීම බලාපොරොත්තුවෙන් වියදම් සඳහා බලය දීම.

30. මේ කොටසේ මීට පූර්වයෙන් ඇති විධිවිධානවල කුමක් සඳහන් වුවද, පළාතේ පළාත් සභා අරමුදල සංස්ථාපනය කළ දිනයෙන් ආරම්භ වන මාස හයකට නොවැඩි කාල සීමාවක් සඳහා අවශ්‍යයැයි ආණ්ඩුකාරවරයා සලකන වියදමක්, ඒ වියදම් පළාත් සභාව විසින් අනුමත කිරීම බලාපොරොත්තුවෙන්, පළාතේ පළාත් සභා අරමුදලින් දැරීමට, ආණ්ඩුකාරවරයා විසින් බලය දිය හැකිය.

## IV වන කොටස

### පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ප්‍රධාන ලේකම්වරයා.

31. ජනාධිපතිවරයා විසින් එක් එක් පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව එම පළාතේ ප්‍රධාන ලේකම්වරයා පත් කළ යුත්තේ ය.

පළාත් සභා රජයේ සේවය.

32. (1) වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව එක් එක් පළාතේ පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් පත්කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ, ඔවුන්ගේ විනය පාලනය මෙයින් එම පළාතේ ආණ්ඩුකාරවරයා සතු කරනු ලබන්නේ ය.

(2) පළාතක ආණ්ඩුකාරවරයා විසින්, පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් වූ ස්වකීය බලතල කලින් කල එම පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරා දෙනු ලැබිය හැක්කේ ය.

(3) පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් බඳවා ගැනීමේ පටිපාටි නියම කිරීම සහ ඒ නිලධරයන්ගේ පැවැත්ම පිළිබඳ රීතිමාලා නියම කිරීම ද උසස් කිරීම් සහ මාරු කිරීම් සිදුකිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නියම කිරීම ද ඒ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය යන මේ කරුණු පිළිබඳව බලතල ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය හා එකී බලතල පවරාදීමේ පටිපාටිය නියම කිරීම ද ඇතුළුව පළාත් සභා රජයේ සේවයේ නිලධරයන්ට අදාළ සියලු කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම හා ඒ කරුණු තීරණය කිරීම ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන්නේය. බඳවා ගැනීමේ පටිපාටි සහ පැවැත්ම පිළිබඳ රීතිමාලා නියම කිරීමේ දී ආණ්ඩුකාරවරයා විසින්, රජයේ සේවයේ අනුරූප ධුර සඳහා නියමිත බඳවා ගැනීමේ පටිපාටි සහ රජයේ සේවයේ අනුරූප ධුර දරන නිලධරයන් සඳහා නියමිත පැවැත්ම පිළිබඳ රීතිමාලා හැකිතාක් දුරට අනුගමනය කළ යුත්තේ ය.

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

33. (1) එක් එක් පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් තුන් දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් ඒ ඒ පළාත සඳහා වන්නේ ය. ආණ්ඩුකාරවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස නම් කළ යුත්තේ ය.

(2) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු, රජයේ නිලධරයකු, අධිකරණ නිලධරයකු හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයකු වේ නම්, ඒ තැනැත්තා පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් නොකළ යුත්තේ ය. නැතහොත් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නො සිටිය යුත්තේ ය.

(3) පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙක් ම, ස්වකීය අත්සන යටතේ පළාතේ ආණ්ඩුකාරවරයා වෙත යවන ලිපියක් මගින් නියමිත දිනයට කලින් සිය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ එම ආණ්ඩුකාරවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් සිය ධුරය දරන්නේ ය. එහෙත් ඒ සෑම සාමාජිකයෙක් ම නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(4) ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකුට සිය කාර්යවලින් නිවාඩු දිය හැකි අතර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(5) පළාත් සභා කොමිෂන් සභාවේ සාමාජිකයකුට එම පළාත සඳහා වූ පළාත් සභාව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවිය යුත්තේ ය. එවැනි යම් සාමාජිකයකුට ගෙවිය යුතු වැටුප පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය. ඒ වැටුප ඒ සාමාජිකයගේ ධුර කාලය තුළ අඩු නොකළ යුත්තේ ය.

(6) පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ යම් සාමාජික ධුරයක් හිස්ව තිබුණ ද, කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තවද, එවැනි යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ තිබූ පමණින් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් නැතහොත් කටයුත්තක් නිර්බල නොවන්නේ ය ; නිර්බල වන්නා සේ නො සැලකිය යුත්තේ ය.

(7) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ කාර්ය සඳහා පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක සාමාජිකයකු රජයේ සේවකයකු ලෙස සැලකිය යුත්තේ ය.

(8) පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද යම් පත්වීමක්, මාරු කිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ නියමයක් නැතහොත් විනය කටයුත්තක් සම්බන්ධයෙන් කරන ලද වෙනත් යම් නියමයක් වෙනස් කිරීමට, අඩු කිරීමට හෝ අවලංගු කිරීමට ඒ පළාතේ ආණ්ඩුකාරවරයාට බලය ඇත්තේ ය.

34. යම් තැනැත්තෙක් ස්වකීය කාර්ය ඉටුකිරීමෙහි ලා හැර, කෙලින්ම හෝ අන් අයුරකින්, කවර වූ හෝ ආකාරයකින්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයකුගේ හෝ යම් තීරණයකට බලපෑමක් කෙරේද නැතහොත් බලපෑමක් කිරීමට තැත් කෙරේද ඒ සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන්නේ ය. ජූරි සභාවක් නොමැතිව පවත්වන නඩු විභාගයකින් පසුව මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාල

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම.

යක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම කට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය :

එසේ වුවද, පළාත් සභා රජයේ සේවයේ ධූරයක් සඳහා ඉල්ලුම් කරන යම් ඉල්ලුම්කරුවකුට හෝ අපේක්ෂකයකුට හෝ යම් තැනැත්තකු විසින් සහතිකයක් හෝ චරිත සහතිකයක් දීම මේ වගන්තියේ කිසිවකින් තහනම් නොවන්නේ ය.

පූර්ණකාලීන සේවය.

35. පළාත් සභා රජයේ සේවයේ යම් ධූරයකට පත් කරනු ලැබූ තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් ස්වකීය ධූරයට අයත් කාර්යයන්හි නොයෙදිය යුත්තේ ය.

දුෂ්කරතා ඉවත් කිරීමේලා ජනාධිපතිවරයාගේ බලය.

36. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී සහ විශේෂයෙන්ම පළාතක් සඳහා වූ පළාත් සභාවක් පිහිටුවීම සම්බන්ධයෙන් දුෂ්කරතා කිසිවක් උද්ගත වුවහොත්, ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන, ඒ දුෂ්කරතාවය ඉවත් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යයි තමාට පෙනී යන ක්‍රියා මාර්ගයක් ගනු ලැබිය හැක්කේ ය.

අන්තර්කාලීන විධිවිධාන.

37. (1) (අ) ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් ප්‍රකාශනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලද (මෙහි මින් මතු "නිශ්චිත පළාත්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් යාබද පළාත් දෙකකට හෝ තුනකට හෝ මේ උපවගන්තියේ විධිවිධාන අදාළ වන බව ප්‍රකාශයට පත් කරනු ලැබිය හැක්කේ ය. තවද, එවිට, ඒ පළාත් සභාවලට පළමු තෝරා පත් කර ගැනීමේ දිනයෙන් ආරම්භව මේ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ඡන්ද විමසීමේ දිනයෙන් අවසන් වන, නැතහොත් ඡන්ද විමසීම සඳහා එක් දිනයකට වැඩි දින ගණනක් නියම කරනු ලැබ ඇත්තේ නම්, ඒ දිනවලින් අන්තිම දිනයෙන් අවසන්වන කාලසීමාව සඳහා, එක් තෝරා පත් කරගනු ලැබූ පළාත් සභාවක්, එක් ආණ්ඩුකාරවරයෙක්, එක් ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ එක් අමාත්‍ය මණ්ඩලයක් ඇත්තා වූ එක් පරිපාලන ඒකකයක් ඒ පළාත් වලින් සංයුක්ත වන්නේ ය.

(ආ) වෙනම රාජ්‍යයක් පිහිටුවීම තම අරමුණ වශයෙන් ඇත්තා වූ ත්‍රස්තවාදී, සටන්කාමී හෝ වෙනත් කණ්ඩායම් විසින් 1987 ජූලි මස 29 වන දින තමන් විසින් දරනු ලැබූ හෝ තමන්ගේ පාලනය යටතේ වූ අවි, වෙඩි ද්‍රව්‍ය, ආයුධ, පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් යුද්ධෝපකරණ ශ්‍රී ලංකාණ්ඩුවට හෝ ශ්‍රී ලංකාණ්ඩුව විසින් නම් කරනු ලැබූ අධිකාරීන්ට හෝ ආපසු භාර දෙනු ලැබ ඇති බවට හා එකී කණ්ඩායම් විසින් එකී පළාත්වල සටන් සහ වෙනත් ප්‍රචණ්ඩ ක්‍රියා අවසන් කර ඇති බවට ජනාධිපතිවරයා සෑහීමට පත්වන්නේ නම් මිස, (1) (අ) උපවගන්තියේ විධිවිධාන උතුරු සහ නැගෙනහිර පළාත්වලට අදාළ විය යුතු බවට ප්‍රකාශ කෙරෙන ප්‍රකාශනයක් ජනාධිපතිවරයා විසින් නොකළ යුත්තේ ය.

(2)(අ) (1)(අ) උපවගන්තියේ විධිවිධාන යටතේ ප්‍රකාශන යක් කර ඇති අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියම යක් මගින්, ජනාධිපතිවරයා විසින්, එක් එක් නිශ්චිත පළාත්වල ඡන්ද විමසීමක් පවත්වනු ලැබිය යුතු යයි නියම කළ යුත්තේ ය. තවද,—

(i) ඒ පළාත එක් පරිපාලන ඒකකයක් වශයෙන් වෙනත් නිශ්චිත පළාත හෝ පළාත් සමග සම්බන්ධ වී පැවතිය යුතු ද ; නැතහොත්

(ii) ඒ පළාත වෙනම ආණ්ඩුකාරවරයෙක්, ප්‍රධාන අමාත්‍යවර යෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් ඇතිව තමන්ගේම පළාත් සභාවක් ඇතිව වෙනම පරිපාලන ඒකකයක් විය යුතු ද

යන්න තීරණය කිරීමට ඒ එක් එක් නිශ්චිත පළාතේ ඡන්ද හිමි යන්ට හැකි වන පිණිස ඒ ඡන්ද විමසීම සඳහා 1988 දෙසැම්බර් මස 31 වන දිනට පසු නොවන දිනයක් හෝ දින නියම කළ යුත්තේ ය ;

(ආ) ජනාධිපතිවරයා විසින්, ස්වකීය අභිමතය අනුව, ගැසට් පත්‍ර යෙහි පළ කරනු ලබන තදනන්තර නියමයන් මගින්, ඒ ඡන්ද විමසීමේ දිනය හෝ දින, කලින් කල, කල් තබනු ලැබිය හැක්කේ ය.

(3) ඒ නිශ්චිත පළාත්වල එක් එක් පළාතේ පවත්වනු ලබන ඡන්ද විමසීමේ දී ඒ පළාත වෙනත් නිශ්චිත පළාත හෝ පළාත් සමග සම්බන්ධ වී පැවතිය යුතු බව, ඒ එක් එක් පළාතේ ඡන්ද හිමියන්ගේ තීරණය වන්නා වූ අවස්ථාවක, ඒ නිශ්චිත පළාත් තෝරා පත් කරගනු ලැබූ එක් පළාත් සභාවක්, එක් ආණ්ඩුකාර වරයෙක්, එක් ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් ඇත්තා වූ එක් පරිපාලන ඒකකයක් වශයෙන් නොකඩව සංයුක්ත වන්නේ ය. තව ද, යම් ලිඛිත නීතියක පළාත් සභාවලට අදාළ විධි විධාන ඒ නිශ්චිත පළාත්, එක් පළාතක් වූ ලෙස තේරුම් ගත යුත්තේ ය :

එසේ වුව ද, නැගෙනහිර පළාතේ එවැනි යම් ඡන්ද විමසීමක දී, ඒ පළාත උතුරු පළාත සමග සම්බන්ධ වී පැවතිය යුතු බව ඒ පළාතේ ඡන්ද හිමියන්ගේ තීරණය වෙතොත්, උතුරු පළාතෙහි ඡන්ද විමසීමක් අවශ්‍ය නොවන්නේ ය. තවද ඒ අනුව එක් පළාත් සභාවක්, එක් ආණ්ඩුකාරවරයෙක්, එක් ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ එක් අමාත්‍ය මණ්ඩලයක් ඇත්තා වූ එක් පරිපාලන ඒකක යක් ඒ පළාත්වලින් සංයුක්ත වන්නේ ය.

(4) (අ) ඒ ප්‍රකාශනයෙහි පළාත් දෙකක් හෝ ඊට වැඩි ගණනක් නිශ්චිතව සඳහන් කර ඇත්තා වූ සහ ඉන් එක් පළාතක් වෙනම ආණ්ඩුකාරවරයෙක්, ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ අමාත්‍ය මණ්ඩල යක් ඇතිව තමන්ගේම පළාත් සභාවක් ඇත්තා වූ වෙනම පරි පාලන ඒකකයක් වශයෙන් සංයුක්ත විය යුතු බව ඒ පළාතේ ඡන්ද හිමියන්ගේ තීරණය වන්නා වූ අවස්ථාවක, ප්‍රකාශනයෙහි නිශ්චිතව සඳහන් පළාත් එක් පරිපාලන ඒකකයක් වශයෙන්

සංයුක්තවීම වහාම අවසන් විය යුතු අතර, ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලැබූ දින සිට ඒ එක් එක් පළාත සඳහා වෙනම් ආණ්ඩුකාරවරයෙක්, ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් ඇතිව වෙනම පළාත් සභාවක් පිහිටුවනු ලැබූ ලෙස සහ සංස්ථාපනය කරනු ලැබූ ලෙස සැලකිය යුත්තේ ය. තවද අනෙක් නිශ්චිත පළාතෙහි හෝ පළාත්වල ඒ වන විටත් ඡන්ද විමසීම පවත්වනු ලැබ නොමැත්තේ නම්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් ඒ වෙනත් නිශ්චිත පළාතෙහි හෝ පළාත්වල ඡන්ද විමසීම අවලංගු කරනු ලැබිය යුත්තේ ය ;

(ආ) ඒ නිශ්චිත පළාත් සභාවල දේපළ බෙදා හැරීම සඳහා සහ ඒ පළාත් එක් පරිපාලන ඒකකයක් ව පැවති කාලසීමාව තුළ ඒ සභාවල නිලධරයන් සහ සේවකයන් සම්බන්ධයෙන්, ඒ සභා විසින් ඇති කර ගන්නා ලද ගිවිසුම් සම්බන්ධයෙන්, ඒ සභා විසින් හෝ ඒවාට විරුද්ධව හෝ පවරනු ලැබූ නඩු සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නියමයක් මගින්, ජනාධිපතිවරයා විසින්, අවශ්‍යයයි සලකනු ලබන විධිවිධාන යොදනු ලැබිය හැක්කේ ය.

(5) ඒ ඡන්ද විමසීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් පැවැත්විය යුත්තේ ය. තවද, ඒ ඡන්ද විමසීම පැවැත්වීමට අදාළ සියලු කාරණා සඳහා විධිවිධාන සලසන නියෝග ජනාධිපතිවරයා විසින් මේ උපවගන්තිය යටතේ සාදනු ලැබිය හැක්කේ ය.

(6) යම් ඡන්ද විමසීමක දී දෙන ලද වලංගු ඡන්දවල ඒකාන්ත බහුතරයකින් යම් යෝජනාවක් අනුමත කරනු ලැබ ඇත්තේ නම්, ඒ ඡන්ද විමසීමේ දී ඒ ඡන්ද හිමියන් වෙත ඉදිරිපත් කරන යෝජනාවේ වාසියට ඒ පළාතේ ඡන්ද හිමියන් විසින් තීරණය කරනු ලැබූ බව සැලකිය යුත්තේ ය.

(7) ඒ සෑම ඡන්ද විමසීමක්ම තිදෙනෙකුගෙන් සමන්විත කාරක සභාවක් විසින් සමීක්ෂණය කරනු ලැබිය යුතු ය. එය එහි සභාපතිවරයා වන අග්‍රවිනිශ්චයකාරවරයා ගෙන්ද ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් දෙදෙනෙකු ගෙන්ද සමන්විත වන්නේ ය. ඔවුන් ජනාධිපතිවරයාට වාර්තා කළ යුත්තේ ය.